# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 2017 අගෝස්තු මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 අගෝස්තු මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 20.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 20.00 යි.

## 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 2017 අගෝස්තු මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 61/2006

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පිහිටුවීම සඳහා ද; ඒ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම සඳහා ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත යටතේ පිහිටුවන ලද ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකට අනුකූලව ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබ, ලංකා ගමනාගමන මණ්ඩලයේ පරිපාලනය යටතේ පැවති හෙයින් ද:

1978 අංක 19 දරන ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩල පනත මගින් 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත ඉවත් කරනු ලැබ, මධ්‍යම ගමනාගමන මණ්ඩලය පිහිටුවනු ලැබූ හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට පවරනු ලැබූ හෙයින් ද:

2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත මගින් 2005 වර්ෂයේ දී 1978 අංක 19 දරන ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩල පනත ඉවත් කරනු ලැබූ හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පරිපාලනය ප්‍රවාහන අමාත්‍යාංශයට පවරනු ලැබූ හෙයින් ද:

සියලු වෘත්තීය සහ තාක්ෂණික පුහුණු ආයතන එකම අමාත්‍යාංශයක විෂය පථය යටතේ පරිපාලනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වන බැවින්, ඊට අනුකූලව ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය ප්‍රවාහන අමාත්‍යාංශයෙන් යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට මාරු කරනු ලැබූ හෙයින් ද:

කලින් කල අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පරිපාලනය සම්බන්ධයෙන් අපහසුතා පැන නැගී ඇති හෙයින් ද, නීතියක් මගින් වෙනම නීතිමය අස්ථිත්වයක් ලෙස ආයතනයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඒ ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය නිශ්චිතව දැක්වීම අවශ්‍ය වී ඇති හෙයින් ද:

2—PL 005299—2,861 (2017/07)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පිහිටුවීම**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පිහිටුවීම.

**2.** (1) (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

අන්තර්කාලීන විධිවිධාන.

**3.** (1) ලංකා ගමනාගමන මණ්ඩලයේ යෝජනා සම්මතයකින් පිහිටුවනු ලැබ, ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර පිළිගනු ලැබූ (මෙහි මින්මතු "ලං.ජ.කා.අ.ආ." යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද ආයතනයට මෙයින් පවරනු ලැබේ.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ ලං. ජ. කා. අ. ආ. සඳහා හෝ ඒ වෙනුවෙන්, ලං.ජ.කා.අ.ආ. විසින් හෝ ඒ සමග නැතහොත් රජය විසින් හෝ රජය සමග, එළඹෙන ලද සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ ලං.ජ.කා.අ.ආ. සඳහා හෝ ඒ වෙනුවෙන් ලං.ජ.කා.අ.ආ. විසින් හෝ රජය විසින් දරන ලද සියලු ණය සහ වගකීම්, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, ආයතනය විසින් හෝ ආයතනය සමග එළඹුණ කොන්ත්‍රාත් සහ ගිවිසුම් ලෙස හෝ ආයතනයේ ණය සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක විය යුතු ය.

(3) නියමිත දිනයට පෙරාතුව ලං. ජ. කා. අ. ආ. යේ කාර්ය සඳහා ලං. ජ. කා. අ. ආ. ට අනුයුක්ත කරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ චංචල සහ නිශ්චල දේපළ සියල්ල, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද ආයතනය වෙත පවරනු ලැබිය යුතු අතර සියලු කාර්ය සඳහා ආයතනයට අයිතිය පවරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ලං. ජ. කා. අ. ආ. සම්බන්ධයෙන් නියමිත දිනයට පෙරාතුව සාදනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින, පනතේ විධිවිධානවලට අනනුකූල නොවන, සියලු රීති සහ නියෝග, නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි, මේ පනත යටතේ සාදන ලද රීති සහ නියෝග ලෙස සලකනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ සාදන ලද රීති සහ නියෝග ලෙස සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම සහ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(5) ලං. ජ. කා. අ. ආ. සම්බන්ධයෙන් වූ ද, ලං. ජ. කා. අ. ආ. විසින් හෝ ඊට එරෙහිව නැතහොත් රජය විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබුවා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පැවතියා වූ ද, සියලු සිවිල් සහ අපරාධ නඩු, අභියාචන සහ වෙනත් නීති කෘත්‍ය, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, ආයතනය විසින් හෝ ආයතනයට එරෙහිව පවරනු ලැබූ නඩු හෝ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ කර්තව්‍ය.

**4.** (අ) මෝටර් රථ කර්මාන්තය සහ නියමිත පරිදි වූ වෙනත් තාක්ෂණික සහ වෘත්තීය කර්මාන්තවල වෘත්තීය පුහුණු පාඨමාලා සහ වැඩසටහන්, සෘජුව ආයතනය මගින් හෝ වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික ක්ෂේත්‍රයේ නියෝජ්‍යායතන මගින් හෝ සකස් කර පවත්වාගෙන යාම;

(ආ) රජයේ සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් ආයතනයේ පුහුණුකරුවන්ගේ සහ උපදේශකයන්ගේ පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඊට පහසුකම් සැලසීම;

(ඇ) මෝටර් රථ කර්මාන්තයේ සහ වෙනත් නියමිත තාක්ෂණික කර්මාන්තවලට සම්බන්ධ ක්ෂේත්‍රවල වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ කරගෙන යාම;

(ඇ) ආයතනයේ වෘත්තීය පුහුණුව නිමකර ඇති තැනැත්තන්ට, වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන සේවා සැපයීම;

(ඉ) පුහුණුව සම්පූර්ණ කර ඇති අභ්‍යාසලාභීන්ට ශ්‍රී ලංකාවේ සහ විදේශවල රැකියා අවස්ථා සැපයීම සඳහා අදාළ බලධරයන්ට සහාය වීම සහ ඒ පිළිබඳව දේශීය සහ විදේශීය සංවිධාන සමග ගිවිසුම්වලට එළඹීම;

(ඊ) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල වෙනත් ආයතන සමග සබඳතා පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම සහ එම වෙනත් ආයතන සමග ගිවිසුම්වලට එළඹීමෙන් ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සඳහා හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(උ) ආයතනයේ වාහන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයේ දී, වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානයේ දී සහ වෙනත් වැඩපොළවල දී, අභ්‍යාසලාභීන්ට ප්‍රායෝගික පුහුණු කිරීම් ලබාදීම අඛණ්ඩව සිදු කිරීම;

(ඌ) නියමිත ක්ෂේත්‍රවල තාක්ෂණ සහ වෘත්තීය පුහුණු කිරීම් පවත්වාගෙන යාමේ සහ අධ්‍යාපනය ලබාදීමේ කාර්යය සඳහා කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම;

(එ) අදාළ කර්මාන්තවල සිදුවන තාක්ෂණ දියුණුව නියාමනය කිරීම සහ ඊට අනුකූලව ආයතනයේ පහසුකම් වැඩිදියුණු කිරීම, නවීකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම;

(ඒ) මෝටර් රථ සහ නියමිත තාක්ෂණික කර්මාන්තවල නියැලී සිටින ජාතික සහ ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇතිව සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු පැවැත්වීම;

(ඔ) මෝටර් රථ සහ නියමිත තාක්ෂණික කර්මාන්ත පිළිබඳව ද, ඒ කර්මාන්තවල වෘත්තීය සහ තාක්ෂණික පුහුණු කිරීම් පිළිබඳව ද, සඟරා සහ වාර ප්‍රකාශන පළ කිරීම; සහ

(ඕ) ආයතනයේ පරමාර්ථ ඉටු කිරීමට යෝග්‍ය වන වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම,

ආයතනයේ කර්තව්‍ය විය යුතු ය.

ආයතනයේ බලතල.

**5.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතනයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:-

(අ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරිම, සේවයේ නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ආ) නියමිත ක්ෂේත්‍රවල වෘත්තීය සහ තාක්ෂණික පුහුණුව සහ අධ්‍යාපනය ලබාදෙන, ආයතනයේ කලාපීය මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම;

(ඇ) නියමිත ක්ෂේත්‍රවල පුහුණුකරුවන් ලෙස සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන් සඳහා පුහුණු වැඩසටහන් සහ පාඨමාලා පැවැත්වීම සහ ඒ වැඩසටහන් සහ පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කර ඇති තැනැත්තන්ට සහතික පත් සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම;

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සහ පාඨමාලා සඳහා අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ හෝ අමුද්‍රව්‍ය සහ වෙනත් යම් උපකරණ මිලදී ගැනීම;

(ඉ) තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සාදන ලද නියෝගවලට අනුව ජාතික මට්ටමේ විභාග සහ පරීක්ෂණ පැවැත්වීම;

(ඊ) නියමිත පුහුණු කිරීමේ ක්ෂේත්‍රවල දී පවත්වාගෙන යන ප්‍රමිති සහ අභ්‍යාසලාභීන් විසින් ලබාගත් ප්‍රතිඵල කලින් කලට ඇගයීමට සහ ගණනය කිරීමට ලක්කොට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම;

(උ) ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු වැඩසටහන්වලින් උපරිම ප්‍රතිඵල ලබාගැනීම සඳහා අලුත් ශිල්පීය ක්‍රම සහ උපකරණ හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඟ) ආයතනයට යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට, උකසට හෝ කුලියට ගැනීම හෝ දීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(එ) ආයතනය විසින් සෘජුව හෝ තත්කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ නියෝජිතයකු මගින් ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම;

(ඒ) (i) ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික ගෙවීම් සහ විනය පාලනය ඇතුළුව ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන්;

(ii) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන්,

රීති සෑදීම;

(ඔ) ආයතනය විසින් සපයනු ලබන පුහුණු කිරීම් සහ සේවා සඳහා වන ගාස්තු සහ වෙනත් අයකිරීම් සිදු කිරීම;

(ඕ) ආයතනයේ අභ්‍යාසලාභීන්, නිලධරයන් සහ සේවකයන් සඳහා විනෝද සහ සුබසාධන පහසුකම්, නිල නිවාස සහ නවාතැන් පහසුකම් සැපයීම; සහ

(ක) ආයතනයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සුදුසු හෝ අවස්ථානුගත යයි ආයතනයට හැඟී යන වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් සිදු කිරීම.

## II වන කොටස

## මණ්ඩලය සංස්ථාපනය කිරීම

ආයතනයේ පරිපාලනය යනාදිය මණ්ඩලය සතු කිරීම.

**6.** (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය කිරීම (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලන මණ්ඩලයක් සතු කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, මේ පනතින් ආයතනය වෙත පවරා ඇති හෝ නියමකර ඇති බලතල, කර්තව්‍ය සහ කාර්ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සිදු කළ යුතු ය.

7. (1) මණ්ඩලය - මණ්ඩලයේ සංයුතිය.

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වූ සාමාජිකයන්ගෙන්, එනම් -

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු;

(ii) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අනුයෝජිතයකු ;

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා;

(iv) තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(v) මේ පනතේ 17 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂ-විදුහල්පතිවරයා; සහ

(ආ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් රථ හෝ කාර්මික ඉංජිනේරු ක්ෂේත්‍රයේ, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් ක්ෂේත්‍රයේ, මූල්‍ය ක්ෂේත්‍රයේ, නීති ක්ෂේත්‍රයේ, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහ ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් තැනැත්තන් විය යුතු තැනැත්තන් අතරින්, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් සිවු දෙනෙකුගෙන්,

සමන්විත වන්නේ ය.

(2) සෑම පත්කළ සාමාජිකයකු ම ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ඉවත් කිරීමෙන් ස්වකීය ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත්කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත පත්කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(3) පත්කළ සෑම සාමාජිකයකුට ම, තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම වෙලාවක, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(4) පත්කළ යම් සාමාජිකයකු රෝගාතුර වීම, අශක්නුතාවකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින් සුදුසු යයි සිතන්නේ නම් යම් පත්කළ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඉන් පසු ඒ සාමාජිකයා ඔහුගේ ධුරය හිස්කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) පත්කළ සාමාජිකයකු මියයාම, ධුරයෙන් අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම යන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත්කළ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(7) නිල බලයෙන් පත් වූ, මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, මණ්ඩලයේ සාමාජිකයකු වීමට හේතු වූ ධුරය ඔහු විසින් දරන තාක් කල්, මණ්ඩලයේ ධුර දරන්නේ ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

**8.** (1) අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයන් අතරින් එක් අයකු, (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත්කළ යුතු ය.

(2) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් සභාපතිවරයාට ස්වකීය ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(3) තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසුව බලාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් එසේ කිරීම යෝග්‍ය යයි සිතන්නේ නම්, සභාපතිවරයා හේතු දක්වා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

මණ්ඩලයේ සාමාජිකත්වයට නුසුදුස්සකු වීමට හේතු.

**9.** යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක සභිකයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින නීතිය යටතේ, සිහිවිකල තැනැත්තකු බවට අනාවරණය වූ හෝ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින නීතිය යටතේ වස්තු භංගත්වයට පත්වූවෙකු ලෙස හෝ බංකොලොත්භාවයට පත්වූවෙකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් කරනු නොලැබූ වස්තු භංගත්වයට පත්වූවෙකු හෝ බංකොලොත් වූවකු වන තැනැත්තෙක් වන්නේ නම්;

(ඈ) සාපරාධී වරදක් මත ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තෙක් වන්නේ නම්;

(ඉ) ආයතනය මගින් හෝ ආයතනය වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාද දරන හෝ භුක්ති විඳින තැනැත්තෙක් වන්නේ නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව.

**10.** මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතරේ යම් පුරප්පාඩුවක් පැවතිය ද එය නොතකා ක්‍රියා කරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතරේ පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීම හෝ නම් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් අවලංගු නොවිය යුතු අතර, අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**11.** මණ්ඩලයේ සියලු සාමාජිකයන්ට හෝ ඉන් කිසිවකුට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය මත අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණ මත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

**12.** (1) මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින් මසකට එක් වතාවක් පවත්වනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය පස්දෙනකු විය යුතු ය.

(2) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තෝරාපත් කර ගත් සාමාජිකයකු, ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, ඒ රැස්වීමේ මුලසුන දරන සභාපතිවරයා හෝ සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයාගේ විධාන.

**13.** අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන්, යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන බලාත්මක කළ යුතු ය.

**14.** අමාත්‍යවරයා විසින්, අවශ්‍ය යයි සලකන අවස්ථාවක දී ආයතනයේ කටයුතු සියල්ල හෝ ඉන් කිසිවක් පිළිබඳව ඔහු විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කර වාර්තා කළ යුතු යයි නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමය කරනු ලැබීමෙන් පසු මණ්ඩලය විසින්, ඒ නියමය බලාත්මක කිරීම සඳහා, ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට සියලු පහසුකම් සැපයීම සහ යම් තොරතුරු ඉදිරිපත් කිරීම කළ යුතු ය.

ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට නියම කිරීමට අමාත්‍යවරයාට ඇති බලතල.

**15.** (1) ආයතනයේ මුද්‍රාව -

ආයතනයේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන, යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින්, නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි තම නම අත්සන් කළ යුතු ය.

(2) ආයතනය විසින්, ආයතනයේ මුද්‍රාව යොදා ඇති සාධනපත්‍ර හෝ ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

## III වන කොටස

## උපදේශන සභාව, අධ්‍යක්ෂ-විදුහල්පති සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පත්කිරීම

**16.** (1) මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ උපදේශන සභාවක් පත් කරනු ලැබිය යුතු යː-

ආයතනයේ උපදේශන සභාව.

(අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් නියෝජිතයකු;

(ආ) විදේශීය නිෂ්පාදිත වාහන සඳහා ශ්‍රී ලංකාව තුළ පත් කරනු ලැබ ඇති නියෝජිතයන් වන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ සමාගම්වලින්, එක් සමාගමකින් එක් අයකු බැගින් නියෝජිතයන් දෙදෙනකු;

(ඇ) විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් කර්මාන්තයේ නියැලී සිටින ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ සමාගමක විධායක නිලධරයකුට පහළ නොවන තනතුරක් දරන නියෝජිතයකු;

(ඈ) කළම්බු ඩොක්යාඩ් සමාගමේ විධායක නිලධරයකුට පහළ නොවන තනතුරක් දරන නියෝජිතයකු;

(ඉ) මොරටුව විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු; සහ

(ඊ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඔටෝමෝටිව් ඉංජිනේරු හෝ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු.

(2) 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ආයතනයේ කර්තව්‍යයවලට සම්බන්ධ සියලු කාරණා පිළිබඳ මණ්ඩලයට සහ අමාත්‍යවරයාට නිර්දේශ ලබාදීම සභාවේ මූලික කර්තව්‍යය වන්නේ ය.

(3) සභාවේ සභාපතිවරයා සභාවේ සාමාජිකයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු ඉල්ලා අස්වීම නිසා, මරණයට පත්වීම නිසා හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා, කලින් ධුරය හිස්කර ඇත්නම් මිස, ඔහු පත්කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, කාලය ඉකුත් වී යාම නිසා ධුරය හිස්කරන සාමාජිකයන් නැවත පත්කිරීම සඳහා සුදුස්සන් වන්නේ ය.

(5) සභාවේ සෑම සාමාජිකයකු ම, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගැනීමෙන් පසුව බලාත්මක විය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින්, එසේ කිරීම සුදුසු යයි සිතන්නේ නම්, හේතු දක්වා සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) සභාවේ සාමාජිකයකු මියයාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම සිදු වූ අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ තැනැත්තා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර එසේ පත් කරන ලද තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(8) සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම වසරකම දෙවතාවක්වත්, සභාවේ සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, සභාපතිවරයා විසින් අවශ්‍ය යයි සිතන විට සහ රැස්වීමක් කැඳවන ලෙස සභාවේ සාමාජිකයන් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ඔහුගෙන් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබූ විට සභාවේ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(9) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතු ය.

17. (1) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා ලෙස කර්තව්‍ය ඉටු කළ යුතු (මෙහි මින් මතු "අධ්‍යක්ෂ-විදුහල්පති" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂ-විදුහල්පතිවරයා ලෙස, නියමිත සුදුසුකම් ඇති තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ යුතු ය. ආයතනයේ අධ්‍යක්ෂ - විදුහල්පති පත්කිරීම.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් අධ්‍යක්ෂ-විදුහල්පති වෙත ගෙවනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ-විදුහල්පති විසින් මණ්ඩලයේ සාමාන්‍ය විධානයන්ට සහ පාලනයට යටත්ව ආයතනයේ අධ්‍යයන සහ පරිපාලන කටයුතු කළමනාකරණය ද, නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පරිපාලනය සහ පාලනය ද, භාරව කටයුතු කළ යුතු ය.

(4) අධ්‍යක්ෂ-විදුහල්පති විසින්, මණ්ඩලයේ අනුමතය ඇතිව, එසේ කිරීම සුදුසු යයි ඔහු විසින් තීරණය කරන අවස්ථාවක දී, මේ පනත මගින් ඔහු වෙත පවරන ලද, පනවන ලද හෝ භාරදෙන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත අභිනියෝජනය කරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා හෝ සේවකයා විසින් අධ්‍යක්ෂ-විදුහල්පතිගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ඒ බලය, කර්තව්‍යය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම කළ යුතු ය.

(5) අධ්‍යක්ෂ-විදුහල්පති ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ස්ථිර පත්වීමක් සිදුකරන තෙක්, අධ්‍යක්ෂ-විදුහල්පති ධුරයේ කාර්යය ඉටුකිරීම සඳහා මණ්ඩලය විසින්, මණ්ඩලයේ සාමාජිකයකු තෝරා පත්කරනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

**18.** (1) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ලං.ජ.කා.අ.ආ.යේ නිලධරයන් සහ සේවකයන් ලෙස සේවය කරනු ලැබූ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන්ට, මණ්ඩලය විසින් සහ ඒ නිලධරයන් සහ සේවකයන් විසින් එකඟ වන නියම සහ කොන්දේසි මත, ආයතනයේ රැකියා ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නිලධරයකු හෝ සේවකයකු ආයතනයේ සේවයෙන් ඉවත් වීමට අදහස් කරන අවස්ථාවක දී, ඔහුට තෝරාගැනීමක් කිරීමට ඇති ඉඩ ප්‍රස්ථාව පිළිබඳ, ආයතනය විසින් ඔහු වෙත දැනුම් දුන් දින සිට මාස හයක් ඇතුළත එසේ ඉවත්වීම සිදුකළ හැකි ය.

(3) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ලං.ජ.කා.අ.ආ.යේ නිලධරයන් සහ සේවකයන් ලෙස සේවය කරනු ලැබූ, (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති නිලධරයන් සහ සේවකයන් නොවන තැනැත්තන්, ඔවුන් ලං.ජ.කා.අ.ආ.යේ සේවය කිරීමේ දී නියම කරන ලද නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත, ආයතනයේ සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබිය යුතු ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ආයතනයේ ඉල්ලීම පරිදි, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය මත, ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, යම්

කාලසීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට, තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(6) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(7) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට ගිවිසගෙන ඇති තැනැත්තකු, ආයතනයේ සේවයේ නියුක්ත වන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරන ලද කාලය, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා, රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) ආයතනයේ ඉල්ලීම මත පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ආයතනය විසින් සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකඟවන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ වන නියම සහ කොන්දේසි ඇතුළත්ව, යම් නියම සහ කොන්දේසි මත, ඒ කාර්ය මණ්ඩලයට, ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(9) පළාත් පාලන සේවයේ යම් නිලධරයකු (8) වන උපවගන්තිය යටතේ, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා ආයතනයේ වෙනත් යම් නිලධරයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

ආයතනයේ නිලධරයන් සහ සේවකයන් වෙත බලතල සහ කර්තව්‍ය අභිනියෝජනය කිරීම.

**19.** ආයතනය විසින් මේ වගන්තිය මගින් පවරන ලද බලය හැර, එහි බලතල හෝ කර්තව්‍යවලින් කිසිවක්, ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත අභිනියෝජනය කරනු ලැබිය හැකි අතර, එවැනි යම් බලයක් හෝ කර්තව්‍යයක් ආයතනයේ විශේෂ හෝ සාමාන්‍ය විධානයන්ට යටත්ව, ඒ නිලධරයා හෝ සේවකයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

## IV වන කොටස

## මුදල්

ආයතනයේ අරමුදල.

**20.** (1) ආයතනයට (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ලං. ජ. කා. අ. ආ. හි බැරට ඇති සියලු මුදල්, නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ අරමුදලට -

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන්කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) ආයතනය විසින් එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැරව ආදායම්, ගාස්තු, අයකිරීම්, ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කවර හෝ ප්‍රභවයකින් ආයතනයට ලැබෙන සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(4) ආයතනයේ අරමුදලින් -

(අ) මේ පනත යටතේ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම වෙනුවෙන් ආයතනය විසින් දරන යම් වියදමක් පියවා ගැනීමට අවශ්‍ය කරන සියලු මුදල් ; සහ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවීමට නියම කර ඇති සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

**21.** අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ආයතනය විසින් බැංකු අයිරා මගින් හෝ අන්‍යාකාරයෙන්, නැතහොත් සාකච්ඡා කර එළඹුන ණය නියම මත, මේ පනත යටතේ ආයතනයේ කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා, ආයතනයට අවශ්‍ය වන යම් මුදල් ණයට ලබාගත හැකි ය: ණය ලබාගැනීමට ආයතනයට ඇති බලතල.

එසේ වුව ද, මේ වගන්තිය යටතේ ආයතනය විසින් ණයට ලබාදුන් යම් මුදලක් සම්බන්ධයෙන් ගෙවීමට ඇති මුළු මුදලේ ප්‍රමාණය කිසිදු අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

**22.** නියමිත දිනයේ සිට හෝ එදිනට පසුව, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන, ආයතනයේ නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය යුතු ය. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන අදාළ වීම.

**23.** නියමිත දිනයේ සිට සහ එදිනට පසුව, 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන, ආයතනයේ නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය යුතු ය. 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන අදාළ වීම.

**24.** ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය. ආයතනයේ මුදල් වර්ෂය.

**25.** රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ආයතනයේ ගිණුම් විගණනය.

## V වන කොටස

### සාමාන්‍ය

රජයේ නිශ්චල සහ චංචල දේපළ ආයතනයට ලබාදිය යුතු බව.

**26.** (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, එම කාර්යය (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ ආඥාපනතේ විධිවිධාන, ආයතනයට ඒ දේපළ විශේෂයෙන් ප්‍රදානය කිරීම හෝ බදු දීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම චංචල දේපළේ සන්තකය සහ පරිහරණය ආයතනය වෙත පවරා, ආයතනය සතු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ රජයේ චංචල දේපළකට බලපාන කිසිදු නියමයක් අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.

**27.** (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක සහ ඒ අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අනුමත කරන අවස්ථාවක දී, ඒ නිශ්චල දේපළ අවශ්‍ය වන කාර්යය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ අර්ථානුකූලව පොදු කාර්යයක් ලෙස, සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ පනත යටතේ ආයතනය වෙනුවෙන් ඒ දේපළ අත්කර ගනු ලැබිය හැකි අතර ආයතනයට පවරනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය වෙත යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**28.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය.

**29.** ආයතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**30.** මේ පනතේ හෝ මණ්ඩලයේ විධිවිධාන මත ආයතනය විසින්, මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්, සභාවේ යම් සාමාජිකයකු විසින්, අධ්‍යක්ෂ-විදුහල්පතිවරයා විසින් හෝ ආයතනයේ යම් නිලධරයකු විසින්, හෝ සේවා නියුක්තයකු විසින් සිදු කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, යම් අධිකරණයක, ආයතනයට හෝ එම තැනැත්තාට එරෙහිව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී, ආයතනය හෝ එම තැනැත්තා විසින් දරන ලද වියදම්, එම වියදම් සද්භාවයෙන් කර ඇති බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, මේ වගන්තියේ සඳහන් යම් තැනැත්තකු හෝ ආයතනය විසින් ලබාගත් හෝ අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

දරන ලද වියදම් අරමුදලෙන් ගෙවිය යුතු බව.

**31.** (1) මේ පනතින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනතින් නියෝග සෑදීමට බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, අමාත්‍යවරයා විසින්, විශේෂයෙන් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යː-

(අ) ආයතනය විසින් වෘත්තීය පුහුණු සහ අධ්‍යාපන පාඨමාලා පැවැත්විය හැකි ක්ෂේත්‍ර;

(ආ) වෘත්තීය සහ තාක්ෂණික පුහුණු පිළිබඳ විවිධ ක්ෂේත්‍රවල උපදේශකවරු ලෙස තෝරා ගැනීමේ දී අවශ්‍ය වන ප්‍රමිතිය;

(ඈ) අභ්‍යාසලාභීන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ආයතන සහ සංවිධාන සමග අභ්‍යාසලාභීන් එළඹිය යුතු පුහුණුවීමේ ගිවිසුම්වල ඇතුළත් විය යුතු නියම සහ කොන්දේසි;

(ඇ) අභ්‍යාසලාභීන්ට විවිධ ක්ෂේත්‍රවල වෘත්තීය හා තාක්ෂණික පුහුණුව ලබාදිය යුතු කාලසීමාව;

(ඉ) අභ්‍යාසලාභීන් විසින් විවිධ වෘත්තීය සහ තාක්ෂණික ක්ෂේත්‍රවල ලබාගත යුතු ප්‍රායෝගික සහ ආයතනික පුහුණුවේ ස්වභාවය;

(ඊ) මේ පනත යටතේ වෘත්තීය සහ තාක්ෂණික පුහුණුව ලබාදීම භාරව සිටින ආයතනවල හා සංවිධානවල බැඳීම්; සහ

(උ) මේ පනත යටතේ වෘත්තීය සහ තාක්ෂණික පුහුණුව ලබාගන්නා අභ්‍යාසලාභීන්ගේ බැඳීම්;

(ඌ) මේ පනත යටතේ වෘත්තීය හා තාක්ෂණික පුහුණුව ලබාගන්නා අභ්‍යාසලාභීන්ගේ වැඩකරන පැය ගණන සහ අභ්‍යාසලාභීන්ට හිමිකම් ඇති නිවාඩු.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එය පළ කරන දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකළ සෑම නියෝගයක් ම ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියමයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ –

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ, බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් වෘත්තීය පුහුණු විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝගයකින් නියම කිරීම අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ;

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය" යන්නෙන් 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අදහස් වේ;

"තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව" යන්නෙන්, 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

33. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.